# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## අති විශෙෂ

අංක 2149/2 - 2019 නොවැම්බර් මස 11 වැනි සඳුදා - 2019.11.11

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)


# I වැනි කොටස: (I) වැනි ඡෙදය - සාමාන්‍ය

## රජයේ නිවේදන

**වෙරළ සංරක්ෂණ සහ වෙරළ සම්පත් කළමනාකරණ පනතේ**

**16 (2ඇ) වගන්තිය යටතේ කරනු ලබන**

**දැන්වීම**

කන්කසන්තුරේ වරාය ප්‍රතිසංස්කරණය කිරීමේ ව්‍යාපෘතිය, යාපනය

**පාරිසරික බලපෑම් ඇගයීමේ වාර්තාව**

1988 අංක 64 හා 2011 අංක 49 දරන පනත් මගින් සංශෝධිත 1981 අංක 57 දරන වෙරළ සංරක්ෂණ සහ වෙරළ සම්පත් කළමනාකරණ පනතේ 16(1) වගන්තියේ විධිවිධානවලට අනුකූලව කොළඹ 01, චෛත්‍ය පාර, අංක 19 දරන ලිපිනයේ ශ්‍රී ලංකා වරාය අධිකාරිය විසින් ඉදිරිපත් කරන ලද යාපනය, කන්කසන්තුරේ වරාය ප්‍රතිසංස්කරණය කිරීමේ ව්‍යාපෘතිය සඳහා වූ පාරිසරික බලපෑම් ඇගයීමේ වාර්තාව මහජන පරීක්ෂාව සඳහා පහත සඳහන් ස්ථානවල දිනපතා පෙ.ව. 8.30 සිට ප.ව. 4.15 දක්වා 2019.11.11 දින සිට දින 30 ක කාලයක් සඳහා තබා ඇත. (සති අන්ත සහ රජයේ නිවාඩු දිනයන් හැර)

මීට අමතරව වෙරළ සංරක්ෂණ සහ වෙරළ සම්පත් කළමනාකරණ දෙපාර්තමේන්තුවේ නිල වෙබ් අඩවිය වන www.coastal.gov.lk මගින් එම වාර්තාව භාෂා තුනෙන්ම පරිශීලනය සඳහා ඉදිරිපත් කර ඇත.

| | | | |
|---|---|---|---|
| 1. | වෙරළ සංරක්ෂණ සහ වෙරළ සම්පත් කළමනාකරණ දෙපාර්තමේන්තුව | - | 4 වන මහල, නව මහලේකම් කාර්යාලය, මාලිගාවත්ත, කොළඹ 10 |
| 2. | ප්‍රාදේශීය සභාව | - | වලිකාමම් උතුර, යාපනය |
| 3. | දිස්ත්‍රික් ලේකම් කාර්යාලය | - | යාපනය |
| 4. | ප්‍රාදේශීය ලේකම් කාර්යාලය | - | තෙලිප්පලෙයි |
| 5. | ධීවර හා ජලජ සම්පත් දෙපාර්තමේන්තුව | - | දිස්ත්‍රික් කාර්යාලය, යාපනය |
| 6. | මධ්‍යම පරිසර අධිකාරිය | - | නො : 104, ''පරිසර පියස'', ඩෙන්සිල් කොබ්බෑකඩුව මාවත, බත්තරමුල්ල |


1A - G 31428 — 37 (2019/11)

*මෙම අති විශෙෂ ගැසට් පත්‍රය* www.documents.gov.lk *වෙබ් අඩවියෙන් බාගත කළ හැක.*

මෙම යෝජිත වරාය ප්‍රතිසංස්කරණය කිරීමේ ව්‍යාපෘතිය නිසා පරිසරය කෙරෙහි වන බලපෑම් පිළිබඳ ඇගයීම් වාර්තාව සම්බන්ධව මහජන අදහස් 2019.11.11 දින සිට දින 30 ක් ඇතුළත වෙරළ සංරක්ෂණ සහ වෙරළ සම්පත් කළමනාකරණ දෙපාර්තමේන්තුවේ අධ්‍යක්ෂ ජනරාල් වෙත ලිඛිතව ඉදිරිපත් කරන ලෙස දන්වමි.

බී. කේ. ප්‍රභාත් චන්ද්‍රකීර්ති,
අධ්‍යක්ෂ ජනරාල්,
වෙරළ සංරක්ෂණ සහ වෙරළ සම්පත් කළමනාකරණ දෙපාර්තමේන්තුව.

නව මහලේකම් කාර්යාලය,
4 වන මහල,
මාලිගාවත්ත, කොළඹ 10.

දුරකථන අංක : 011-2449754, 011-2387922, 011-2449197,
ෆැක්ස් අංක : 011-2438005, 011-2472623.

11 - 1395

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.